නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව

බස්නාහිර පළාත

# පුරවැසි ප්‍රඥප්තිය

**“ඔබ දැන් ප්‍රවේශ වන්නේ ඔබට සේවය කිරීමට සූදානම්ව සිටින ස්ථානයටයි”**

***අපගේ දැක්ම***

*"බස්නාහිර පළාත්වාසී සියළුම*

*අඩු ආදායම්ලාභී පවුල් ඒකකයන්ට*

*ජීවත්වීමට ස්ථිර නිවසක් "*

***අපගේ මෙහෙවර***

*"බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභී ජනතාවට*

*සුදුසු නිවසක් ඉදිකර ගැනීමට හා පවතින නිවස වැඩිදියුණු කිරීම සඳහා*

*ආධාර ලබාදීම හා 1972 අංක: 7 දරණ ගෙවල්කුලී පනතේ*

*විධිවිධාන ක්‍රියාවට නැංවීමෙන් සහනය සලසා දීම"*

**අපගේ සේවය,**

- **අවංකව,**
- **ප්‍රඥාවන්තව**
- **ආචාර සම්පන්නව**
- **අවබෝධයෙන් යුක්තව**
- **අපක්ෂපාතීව**
- **විනිවිදභාවයෙන් යුක්තව**
- **වගවීමෙන්**
- **අප්‍රමාදව**
- **කාර්යක්ෂමව හා සඵලතාවයෙන්**

**ලබාදීමට කැපවී සිටින්නෙමු.**

නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප)

| ලබාදෙන සේවය | සේවය ලබාදීමේ ප්‍රමිති (පැය/සති/දින) | ඉදිරිපත් කල යුතු තොරතුරු/ලේඛණ | අදාල නීති,සංග්‍රහ,රෙගුලාසි ආදිය | ඔබට උදව් කල හැක්කේ (නිලධාරියාගේ නම,තනතුර,ස්ථානය,දුරකථන /ෆැක්ස්/විද්‍යුත් තැපැල) |
|---|---|---|---|---|
| 1972 අංක: 7 දරණ ගෙ.කු.ප 18 අ වගන්තිය යටතේ කුලී නිවැසියෙකුට කුලියට දෙන ලද පදිංචිවීමේ හෝ ව්‍යාපාරික කාර්යය සඳහා පාවිච්චි කරන අවු:40 ට වඩා පැරණි ගොඩනැගිල්ලක් කඩා දමා ප්‍රතිසංවර්ධනය කිරීමට අවසර ලබාදීමට අදාළ අයදුම්පත් භාර ගැනීම | විනාඩි 5 | ❖ **අයදුම්පත සමඟ පහත ලේඛන**<br>➢ අදාළ දේපලේ අයිතිය සනාථ කිරීමට අදාළ ඔප්පුව/බිම් සැලැස්ම,<br>➢ අදාළ ගොඩනැගිල්ල වසර 40 කට වඩා පැරණි බව තහවුරු කිරිමට අදාළ ලේඛන,<br>➢ නව ගොඩනැගිල්ල සෑදීම සඳහා මුදල් ප්‍රතිපාදන ඉල්ලුම්කරු සතුව ඇති බව තහවුරු කිරිමට ඇති ලේඛන,<br>➢ ප්‍රතිසංවර්ධන යෝජනා ක්‍රමය පිළිබඳ අනුමත ගොඩනැගිලි සැලැස්ම, වියදම් ඇස්තමේන්තුවක් හා ප්‍රමාණ සමීක්ෂණ ලැයිස්තුවක් | 1972 අංක: 7 දරණ ගෙවල්කුලී පනත හා 1980 හා 2002 සංශෝධන පනත් | ඩබ්.එම්.භාග්‍යා ලක්මාලි වීරසිංහ<br>නිවාස කොමසාරිස්,<br>දු.අංකය: 011-2092730<br>ෆැක්ස් : 011-2092757<br>නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප) |
| 1972 අංක:07 දරණ ගෙ.කු.ප.22(1) හා 22(2) වගන්ති යටතේ මාසික සම්මත කුලිය රු:100/- ට අඩු හා රු:100/- ට වැඩි ස්ථානයක කුලී නිවැසියා නෙරපීම සඳහා වන නඩු කටයුතු වලට අදාළ මුදල් | විනාඩි 30 | ➢ මාසික සම්මත ගෙවල්කුලිය තීරණය කරන ලද ලේඛනය | 1972 අංක: 7 දරණ ගෙවල්කුලී පනත හා 1980 හා 2002 සංශෝධන පනත් | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| තැන්පතු භාර ගැනීම. | | | | |
| **ලබාදෙන සේවය** | **සේවය ලබාදීමේ ප්‍රමිති (පැය/සති/දින)** | **ඉදිරිපත් කල යුතු තොරතුරු/ලේඛණ** | **අදාල නීති,සංග්‍රහ,රෙගුලාසි ආදිය** | **ඔබට උදව් කල හැක්කේ (නිලධාරියාගේ නම,තනතුර,ස්ථානය,දුරකථන /ෆැක්ස්/විද්‍යුත් තැපැල)** |
| ප්‍රදේශයේ නිවාස අයිතිකරුවන් හා කුලී නිවැසියන් අතර පවතින ගැටළු නිරාකරණය කිරිම | දින 30 | ➢ අදාළ ගෙවල්කුලී මණ්ඩලයෙන් අයදුම්පතක් ලබා ගැනීම හා<br>➢ ගෙවල්කුලී මණ්ඩලය විසින් නියම කරන ලද මුදල ගෙවූ කුවිතාන්සිය | 1972 අංක:7 දරණ ගෙවල්කුලී පනත හා 1980 අංක:55හා 2002 අංක: 26 දරණ සංශෝධන | ගෙ.කු.ම.ලේකම් -කොළඹ 1,2, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, දෙහිවල , මොරටුව,මහරගම, බත්තරමුල්ල, අවිස්සාවේල්ල, ගම්පහ,මීගමුව, වේයන්ගොඩ,පැලියගොඩ, කලුතර,පානදුර ගෙවල්කුලී මණ්ඩල |
| අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ආධාර ලබා දීම. | ආධාරලාභීන් විසින් සම්පූර්ණ කර එවන ලද අයදුම්පත් ලැබුන දින සිට දින 03 ක් ඇතුලත | **නිවාස ආධාරයක් ලබා ගැනීම සඳහා පලමුව ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර අයදුම්පතක් ලබාගත යුතුය**<br>**අයදුම්පත සමඟ**<br>➢ ඉඩමේ අයිතිය තහවුරු කිරිම සඳහා ඔප්පු පිටපතක්.<br>➢ තමන්ගේ නොවන ඉඩමක නම් අයිතිකරු විසින් නිවස ඉදිකිරීමට අවසර ලබාදෙන බවට ලිපියක්<br>➢ ඉඩමේ අයිතිකරු මියගොස් ඇතිනම් කලත්‍රයා විසින් විවාහ සහතිකයේ පිටපතක්,මරණ සහතිකයේ පිටපතක්,දරුවන් ගේ උප්පැන්න සහතික ඉදිරිපත් කල යුතුය.<br>➢ මාසික ආදායම රු:8000/- ට වඩා අඩු විය යුතුය.<br>➢ වියදම් ඇස්තමේන්තුවක් | 1990 අංක 03 දරණ නිවාස සංවර්ධන අරමුදලේ ප්‍රඥප්තිය හා<br>ගැසට් නිවේදන | ඩබ්.එම්.භාග්‍යා ලක්මාලි වීරසිංහ නිවාස කොමසාරිස්,<br>දු.අංකය 011-2092730<br>ෆැක්ස්: 011-2092757<br>නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප) |

**අපගේ අපේක්ෂාව**

අප ආයතනය කෙරෙහි ඔබ තබා ඇති විශ්වාසය ගැන ඔබට ස්තුති කරන අතර, අපගේ සේවය සඳහා ඔබ විසින් කරනු ලබන ඉල්ලීම්, යුක්ති සහගත සාධාරණ සහ නියමිත කලට ඉදිරිපත් කිරීමෙන් ද, අංග සම්පූර්ණ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ද අපගෙන් අපේක්ෂා කළ හැකි සහ අපේක්ෂා කළ නොහැකි දේ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා තිබීම මගින් ද ඔබට අපට සහයෝගය පළකල හැකි බව දන්වනු කැමැත්තෙමු.

**අපගේ ප්‍රමිතීන්**

ඔබගෙන් ලැබෙන සෑම ලිඛිත ඉල්ලීමකට ක්ෂණික ප්‍රතිචාර අපෙන් ලැබෙනු ඇත. අපේ ප්‍රතිචාරය දින 07 ක් ඇතුලතදී ඔබට ලැබෙනු ඇත.

ඔබේ ඉල්ලීම සමඟ ඉල්ලා ඇති තොරතුරු, ලිඛිත ලියකියවිලි සහ ගාස්තු ඉදිරිපත් කර ඇත්තේ නම්, ඔබ ඉල්ලා ඇති සේවය අප විසින් දැනුම් දී ඇති කාල පරාසය තුළ ඔබට ලබා දීමට අපි බැඳී සිටින්නෙමු.

අවසාන තීරණය ගැනීම ප්‍රමාද විය හැකි හෝ අනිවාර්යයෙන්ම ප්‍රමාද වන අවස්ථාවක දී හෝ ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වූ විටක එයට හේතුව අප විසින් ක්ෂණිකව දන්වනු ලැබේ.

**පැමිණිලි සහ සහන ලබාදීමේ ක්‍රමවේදය**

අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආචාර සම්පන්නව, අවශ්‍ය උපකාරය හා සේවාවන් ඔබට ලබා දෙනු ඇත. ඉහත සඳහන් ප්‍රමිතීන් හා සම්බන්ධ ඔබට ඇති පැමිණිලි පහත සඳහන් නිලධාරියා වෙත කරුණාකර යොමු කරන්න.

නම : ඩබ්.එම්.භාග්‍යා ලක්මාලි වීරසිංහ

තනතුර : නිවාස කොමසාරිස්

පිහිටි ස්ථානය : නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව, (බ.ප), පළාත් සභා ගොඩනැඟිල්ල<br>
අංක: 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල<br>
දුරකථනය: 011-2092730<br>
ෆැක්ස් : 011-2092757

- සියළු පැමිණිලි ලද බව දින 03 ක් ඇතුළත දන්වන අතර අවසාන පිළිතුර දින 07 ක් ඇතුළත දන්වනු ලැබේ.
- සේවාලාභී මහජන ඔබෙන් ඉදිරිපත් වන යෝජනා අපි සතුටින් භාර ගනිමු.
    - අපගේ සේවාවන් ලබන ඔබ හෝ ඔබේ නියෝජිතයින් සමඟ අප අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලැබේ. ඔබ අප සමඟ සම්බන්ධ වීමට අපේක්ෂා කරන්නේ නම් කරුණාකර 011-2092730 දුරකථන අංකයෙන් අමතන්න.
    - මෙම ප්‍රඥප්තියට ඇතුළත් කර ඇති කරුණු පිළිබඳ ඔබේ උපදෙස් ලබා ගැනීමට හෝ ඔබේ අදහස් ලබා දීමට ඔබ දක්වන කැමැත්ත ඇතුළත් කර ඔබගේ විස්තර අපගේ www.depthc.wp.gov.lk වෙබ් අඩවියට ඇතුළත් කරන්න. නැතහොත් අපගේ විද්‍යුත් තැපැල www.housingcommissionerwp@gmail.com වෙත යොමු කරන්න.

පුරවැසි ප්‍රඥප්තිය, අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ඔබත් අපත් එක්ව දරණ ඒකාබද්ධ ප්‍රයත්නයකි. ලබාදෙන සේවය තවත් වැඩි දියුණු කිරීම සඳහා සහාය වන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

**ප්‍රඥප්තිය යටතේ ලබා දෙන සේවාවන් නිරතුරුව සංශෝධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට අපි බැඳී සිටිමු ....!**